**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉද්රිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එළුවන්කුලම සංචාරක බංගලාව පිහිටි ඉඩමේ වටිනාකම හා රු.25,195,722ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිලි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉඩම්වල තක්සේරු වටිනාකම් හා ප්‍රාග්ධන වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ නිර්දේශය යටතේ ඉදිරියේදී ප්‍රාග්ධන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | වනාතවිල්ලුව ළමා උද්‍යානය ඉදිකර ඇති ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | වනාතවිල්ලුව ළමා උද්‍යානය ඉදිකර ඇති ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | 2010 වර්ෂයට පෙර සභාව විසින් මිලදීගෙන තිබුණු එකතුව රු.2,798,117ක් වූ වත්කම් ශේෂ 03ක් භෞතිකව හඳුනාගැනීමට නොහැකිව තිබියදී වත්කම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතු අතර ප්‍රාග්ධන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2010 වර්ෂයට පෙර වත්කම් මිලදී ගැනීම් තොරතුරු සම්බන්ධව ලේඛනයක් නොමැති බැවින් මෙම ශේෂය කුමන වත්කමට අදාලද යන්න නිශ්චිතව හඳුනාගත නොහැක. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂ 12ක එකතුව රු.12,269,467ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවා ලැබිය යුතු ශේෂය රු.874,830ක් විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අක්කර බදු විශාල ප්‍රමාණයක් අයකර ගත නොහැකි තත්ත්වයක පවතී. කපාහැරීම සඳහා ඉල්ලීමක් කර ඇත. තවද කඩ කාමරවල බදු අයිතිය ආපසු පවරා ගැනීමට ඉදිරි කටයුතු කරමින් සිටින බව දන්වා සිටිමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 06ක එකතුව රු.13,164,862ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ගෙවිය යුතු ශේෂ එකතුව රු.3,467,635ක් විය. | ගෙවිය යුතු ශේෂ හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි 157 ප්‍රකාරව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.277,963,288ක් වූ ගිණුම් විෂයයන් 10ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **1988** ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) අංක 5(3) රීතිය | ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර පරීක්ෂාවක් පවත්වා නොතිබුණි. | ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ii) අංක 65 රීතිය | ගෙවීම් සඳහා ඉඩදී තිබෙන කාලසීමාව අවසානයේදී ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iii) අංක 66 රීතිය | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) අනුව ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iv) අංක 205 රීතිය | 2018 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විනාශ කළ යුතු හා වෙන්දේසි කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ නිර්දේශ අනුව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| ( v) අංක 218 රීතිය | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | | |
|---|---|---|---|
| 1645 මුදල් රෙගුලාසිය | සභාව විසින් භාවිතා කරනු ලබන සියළුම වාහනවල දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,662,719ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.2,622,281ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,583 | 1,789 | 1,565 | 1,184 | 895 | 1,036 | 990 | 960 |
| කුලී | 2,637 | 1,525 | 1,795 | 945 | 3,007 | 1,325 | 1,451 | 1,330 |
| බලපත්‍ර ගාස්තු | 458 | 307 | 287 | 19 | 571 | 384 | 6,449 | - |
| වෙනත් ආදායම් | 36,654 | 28,719 | 27,849 | 4,070 | 40,537 | 28,324 | 32,322 | 1,518 |
| | 43,332 | 32,340 | 31,496 | 6,218 | 45,010 | 31,069 | 41,212 | 3,808 |

රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

**2.2.2 අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.663,642ක හිඟ ශේෂයක් පැවති අතර එම හිඟයෙන් රු.600,168ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයවීමට තිබුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතු අතර නිවැරදි හිඟ ශේෂයන් පරීක්ෂා කර අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අක්කර බදු විශාල ප්‍රමාණයක් අය කර ගත නොහැකි තත්ත්වයක පවතී. මේ සම්බන්ධව මහ සභාව දැනුවත් කර දිගුකාලීනව අය කර ගත නොහැකි අක්කර බදු මුදල් කපා හැරීම සඳහා මේ වන විට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉල්ලීමක් කර ඇත. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කුලී පදනම මත ලබාදෙන ලද කඩ කාමරවලින් අයකළ යුතු රු.670,463ක් අයකර ගැනීමට විධිමත් පියවරගෙන නොතිබුණු අතර එම කඩ කාමර නැවත පවරා ගැනීමට හෝ පියවරගෙන නොතිබුණි. | අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂය තුලදී වාරික නොගෙවන ලද කඩ කාමරවල බිල්කිරීම් නවත්වා බදු අයිතිය නැවත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,201,702ක් හා මුද්දර ගාස්තු රු.2,776,237ක් විය. | ලැබිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් ලබාගැනීමට අවශ්‍ය උපලේඛනයන් සකස් කොට 2020 ජූනි මාසයේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව 1988 වර්ෂයේදී කරුණු 42කට අදාළව අතුරු ව්‍යවස්ථා ගැසට් කර තිබූ අතර අතුරු ව්‍යවස්ථා 05ක් වැළඳගෙන තිබුණි. ඒ තුලින් සභා ආදායම් රැස්කළ හැකි අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර නොතිබුණි. උදා:- වාහන (ත්‍රීරෝද) නැවතුම් පොලවල් | වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වේ. | ආයතනයට අදාළව පවතින සියළුම අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. නමුත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයන් පවතී. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

#### (ආ) පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉදිකරන ලද කඩ කාමර 57ක භූමියෙහි අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙතින් නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පවරා ගැනීම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ඉඩම් නිත්‍යානුකූලව සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ප්‍රාදේශීය ලේකම් විසින් මිනුම් නියෝගද නිකුත් කර ඇත. තවද මුදල් ගෙවා මිනුම් කටයුතු සිදුකර ගැනීමේ හැකියාවක්ද අප ආයතනයට නොමැත. |

#### (ඇ) ඉටු නොකළ කාර්යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය බල ප්‍රදේශය රමණීය කලපු තීරයකින් හා ඔයවල් 02කින් යුක්ත බැවින් ස්වභාවික පරිසරය | සංවර්ධනයට අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ | පරිසර නිලධාරී දැනුවත් කර ඉදිරියේදී වෙරළ සංරක්ෂණ වැඩසටහන් සිදු කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| ආරක්ෂා කිරීම සිය මෙහෙවරෙහි කොටසක් වුවද කලපු තීරය ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම හා එහි මත්ස්‍ය සම්පත වර්ධනය තුලින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සභාව විසින් අවශ්‍ය පියවරගෙන නොතිබුණි. | යුතු වේ. | කරන බව කාරුණිකව දන්වා සිටිමි**.** |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට කසළ කළමනාකරණ කටයුතු මුළුමනින් නවතා දමා තිබූ බැවින් රු.4,238,619ක් වැයකර ඉදිකර තිබූ කොම්පෝස්ට් අංගනය පූර්ණකාලීනව නිශ්ක්‍රීයව පැවතුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කොට නිශ්ක්‍රීය වත්කම් පූර්ණකාලීනව ප්‍රයෝජනයට ගත යුතු වේ. | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් බිමෙහි කොන්ක්‍රීට් කැඩී තිබුණු බැවින් ප්‍රමිතිගතව නිෂ්පාදනය කර ගත නොහැකි නිසා එය සකස් කර ඉදිරියේදී කොම්පෝස්ට් නිෂ්පාදනය කරන බව දන්වමි. |

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී එයට අනුගත වී තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සභාවේ පවතින භෞතික හා මානව සම්පත් අනුව උත්සාහ කර ඇති බව කාරුණිකව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | |
|---|---|---|
| එළුවන්කුලම ජල පොම්පාගාරයට විදුලිය ලබාගැනීම සඳහා ප්‍රතිපූර්ණ පදනම මත සභාව විසින් වැය කරන ලද රු.58,775ක මුදල වසරකට අධික කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනියම් හා කොන්ත්‍රාත් වශයෙන් සේවකයින් 23 දෙනෙකුගේ අතිරික්තයක් වූ අතර එම සේවකයින්ට සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි. | කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට පියවර ගත යුතු වේ. | ප්‍රාථමික සේවකයින් ලෙස සඳහන් වන පෙර පාසල් සහායිකාවන් අංක 25/2014 චක්‍රලේඛ අනුව බඳවාගෙන ඇත. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් වැටුප් ප්‍රතිපූර්ණ ලැබෙන බව සඳහන් කරන අතර අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින්ට සභා ආදායම් (සියාම් සිටි ව්‍යාපෘතිය) හරහා වැටුප් ගෙවන ලදී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.9,001,205ක් වූ ගොඩනැගිලි 05ක් හා උපකරණ ක්‍රියාකාරී තත්ත්වයක නොපැවතීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. | නිශ්කාර්ය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කළ යුතු වේ. | ඉදිරියේදි විධිමත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාහන සේවා මධ්‍යස්ථානය සඳහා පුස්තකාල සහායකයෙකු හා අනියම් කම්කරුවන් දෙදෙනෙකු යොදවා තිබුණු අතර සේවා මධ්‍යස්ථානයේ ඇති භෞතික | මානව හා භෞතික සම්පත් ඵලදායී ලෙස උපයෝගී කරගත යුතු වේ. | වාහන සේවා මධ්‍යස්ථානයට යොදා සිටින පුස්තකාල සහායක ඉදිරියේදී 06 කණ්ඩුව ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුස්තකාලයට යොමු කරන අතර එහිදී ඔහුගෙන් සේවා මධ්‍යස්ථානයේ සහ පුස්තකාලයේ ලේඛනගත කිරීම යන සේවා සේවාවන් දෙකම ඉටුකර |

| | | | |
|---|---|---|---|
| | සම්පත් මෙන්ම මානව සම්පත්ද බොහෝ විට ඌන උපයෝජිතව පැවතුණි. සේවා මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන තොග ලේඛන මසකට වැඩි කාලයක් තුලනය කර නොතිබුණු අතර 2020 පෙබරවාරි 10 දින කරන ලද නියැදි භෞතික පරීක්ෂාවට අනුව රු.4,600ක තොග ඌනතාවයක් නිරීක්ෂණය විය. සභාවට අයත් වාහන සේවා කිරීමට දරන වියදම් සේවා ස්ථානයේ ආදායම් ලෙස ගණනය කිරීමෙන් පසුවද සේවා මධ්‍යස්ථානයේ වාර්ෂික පාඩුව 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.743,788ක් හා රු.924,934ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | | ගැනීමට බලාපොරොත්තු වේ. |
| (ඇ) | රු.3,633,827ක් වැයකර ඉදිකර තිබූ එරික්කන්විල්ලුව ජල ව්‍යාපෘතියේ දිනකට ජලය ලීටර් 20,000ක් නිෂ්පාදනය කළ හැකි වුවද නිෂ්පාදනය කර තිබුණේ ජල ලීටර් 1000ත් 3000ත් අතර ප්‍රමාණයක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මාස 08ක කාලය තුල ජල අලෙවි ආදායම ඉක්මවා වියදම් වැඩිවීම නිසා රු.50,377ක පාඩුවක් සිදුවී තිබුණි. | උපරිම ධාරිතාවයෙන් නිෂ්පාදන කටයුතු සිදුකර ජල අලෙවිය සඳහා වැඩ පිළිවෙලක් සකසා ලාභ උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි විධිමත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| පිළියෙල කර තිබූ අයවැය අනුව වැය විෂයයන් 27ක් සඳහා සලසා තිබුණු රු.3,292,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර තවත් වැය විෂයයන් 24ක් සඳහා සළසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 60 සිට සියය දක්වා ඉතිරි වීම් එකතුව රු.26,113,487ක් විය. | තාත්විකව අයවැය පිළියෙල කළ යුතු අතර, අදාළ කාර්යයන් කාලීනව ඉටු කිරීමට පියවර ගත යුතු වේ. | 2019 වර්ෂයේදී අපේක්ෂිත පුනරාවර්තන සහ ප්‍රාග්ධන ආදායම් රැස් කිරීමට අපොහොසත්වීම මත ඇතැම් වැය විෂයයන් යටතේ වියදම් දැරීමට නොහැකි විය. තවද සමහර වැය ශීර්ෂවලින් වියදම් දැරීමේ අවශ්‍යතාවක් ඇති නොවීම මතද ප්‍රතිපාදන ඉතිරිවීමක් ලෙස පෙන්නුම් කරයි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර තිබුණද ඊට අදාළ වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. | සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සෑම මසකම අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇති අතර, 2019 දෙසැම්බර් මස දක්වා අභ්‍යන්තර විගණනය සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |